**B**

# නිවේදනය

පාර්ලිමේන්තුවේ පසුපෙළ මන්ත්‍රීවරයන්ට හදිසි පොදු වැදගත්කමකින් යුතු කාරණයක් පිළිබඳව සභාව කල් තබනු ලබන අවස්ථාවේදී ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් සලසා දීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් 2021 මාර්තු 25 බ්‍රහස්පතින්දා පවත්වන ලද රැස්වීමේදී තීරණය කරන ලද බව පාර්ලිමේන්තුවට දැනුම්දීමට කැමැත්තෙමි.

ඊට අනුකූලව, සභාව කල් තබන අවස්ථාවේදී යෝජනා සඳහා වෙන්කළ දිනයන්හිදී, ඒ සඳහා වෙන්කර ඇති පැයක කාලයෙන් මිනිත්තු විස්සක (20) කාලයක් **"සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න"** දෙකක් (02) පමණක් ඇසීම සඳහා වෙන්කර දී ඇති බව දන්වා සිටිමි.

සභාව කල් තබන අවස්ථාවේදී අසනු ලබන මෙම ප්‍රශ්න මතු දැක්වෙන මාර්ගෝපදේශවලට යටත්ව සිදු කරනු ලැබිය යුතු බවත් සඳහන් කරමි:—

**<u>සභාව කල් තබන අවස්ථාවේදී ප්‍රශ්න සඳහා මාර්ගෝපදේශ</u>**

1. සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න සඳහා වෙන් කළ දිනයන්හිදී, ඒ සඳහා මිනිත්තු විස්සක (20) කාලයක් වෙන් කරනු ලැබිය යුතු අතර පිළිවෙළින් ආණ්ඩු පාර්ශ්වය සහ විරුද්ධ පාර්ශ්වය සඳහා එක් ප්‍රශ්නයක් බැගින් ප්‍රශ්න දෙකක් (02) ක් සඳහා පමණක් ඉඩ දෙනු ලැබිය යුත්තේ ය.

අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ප්‍රශ්නය ඇසීම සඳහා මිනිත්තු පහක (05) කාලයක් ද, අදාළ අමාත්‍යවරයාට ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම සඳහා මිනිත්තු පහක (05) කාලයක්ද වෙන් කරනු ලැබිය යුත්තේ ය.

2. සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, **'හදිසි පොදු වැදගත්කමකින් යුතු කාරණා'** සඳහා පමණක් සීමා විය යුත්තේ ය.

   අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට දිනකට එවැනි ප්‍රශ්න එකක් (01) පමණක් ඇසීම සඳහා අවස්ථාව සලසා දෙනු ලැබිය යුත්තේ ය.

   සභාව කල් තබන අවස්ථාවේ අදාළ ප්‍රශ්න, හදිසි පොදු වැදගත්කමකින් යුතු ද යන්න කථානායකවරයා විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

3. ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් පෞද්ගලිකව හෝ ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල හෝ මඟින් අදාළ ප්‍රධාන සංවිධායකවරයා වෙත යොමුකරනු ලැබිය හැකි අතර අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ඊට ස්වකීය අත්සන යොදනු ලැබ තිබිය යුත්තේ ය.

   එවැනි ඕනෑම ප්‍රශ්නයක් අදාළ ප්‍රධාන සංවිධායකවරයා විසින් නියමිත දිනයට පෙර දින පූ.භා. 10.00 වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත යවනු ලැබිය යුතු අතරම, අදාළ අමාත්‍යවරයා වෙතද විධිමත් ලෙස දැනුම් දීමට හැකිවන පිණිස එකී ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් මධ්‍යාහ්න 12.00 ට පෙර පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්වරයා වෙත යොමු කරනු ලැබිය යුත්තේ ය.

4. එකී ප්‍රශ්නවලට සභාගර්භයේ දී පිළිතුරු ලබා දීමට හැකිවනු පිණිස, පාර්ලිමේන්තුවේ සභානායකවරයාගේ ලේකම්වරයා විසින් එම ප්‍රශ්න අදාළ අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුත්තේ ය.

   එවැනි ඕනෑම ප්‍රශ්නයක් සඳහා සභාගර්භයේ දී පිළිතුරු ලබා දීමට හෝ ලබා නොදීමටත්, සවිස්තරාත්මක තොරතුරු රැස්කරන ආකාරයේ දීර්ඝ පිළිතුරු අවශ්‍යවන ප්‍රශ්නයක් නම් එය වාචික

පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් ලෙස ලැයිස්තුගත කරන ලෙස ඉල්ලා සිටීමටද අදාළ අමාත්‍යාවරයාට අයිතියක් තිබිය යුත්තේ ය.

5. සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් සභා ගර්භයේදී අසනු ලබන අවස්ථාවේදී කලින් දැනුම් දීම කරනු ලැබ තිබූ ප්‍රශ්නයට පමණක් සීමා විය යුත්තේ ය.

6. කිසිදු අතුරු ප්‍රශ්නයක් අසනු නොලැබිය යුත්තේ ය.

7. **"සභාව කල් තබන අවස්ථාවේදී ප්‍රශ්න"** සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 36 යටතේ සඳහන් රීති එපරිද්දෙන්ම අදාළ විය යුත්තේ ය.

**********